**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2014**

-----------------------------------------------------------------------------------------------------

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 ජනවාරි 25 දින නිකුත් කරන ලද අංක 1533/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද 2008 අංක 01 දරන මෝටර් වාහන වායු විමෝචන පාලනය කිරීම් නියෝග යටතේ සහ 2009 අංක 8 දරන මෝටර් වාහන පනත මගින් සංශෝධිත මෝටර් වාහන පනතේ (203 අධිකාරය) 29 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.රා.අ.ගි.ප්‍ර.)

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 අනුව ගිණුම්වල සිදු කරනු ලබන පෙර කාලපරිච්ඡේද දෝෂ ගැලපීම්වලට අදාල වැරදි නිවැරදි කිරීම් පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමක් ලෙස වෙනස් කර සටහනක් මඟින් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතු වුවද රු. 9,494,637 ක් වූ පෙර වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරුවලට කළ ගැලපීම් සමුච්චිත අරමුදලට ගලපා තිබුණ නමුත් ඒ පිළිබඳව සටහන් මඟින් තොරතුරු අනාවරණය කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂය තුල ගනුදෙනු ලෙජරයට පිටපත් කිරීමේදී සිදු වූ දෝෂ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු එකතුව රු.3,136,139 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කිරීම වෙනුවට පුනරාවර්තන වැය ගිණුමට හර කර තිබුණි. එය නිවැරදි කිරීමේ ජර්නල් සටහන මගින් රු.1,387,015 ක පමණක් ස්ථාවර වත්කම් ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කර තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.3,136,139 කින් සහ ස්ථාවර වත්කම් රු.1,749,124 කින් අඩුවෙන් ද සමුච්චිත අරමුදල රු. 1,387,015 ක් වැඩියෙන් ද දක්වා තිබුණි.

### 2.3 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීතිරීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| මුදල් රෙගුලාසි 371(2) (ආ) වගන්තිය | මාණ්ඩලික නිලධාරියෙකුට තත්කාර්ය අතුරු අග්‍රිමය ලෙස රු.20,000 ක් ලබාදිය හැකි වුවත්, එකී සීමාව ඉක්මවා නිලධාරීන් 08 දෙනෙකුට එකතුව රු.1,166,100 ක අත්තිකාරම්, අවස්ථා 27 ක දී ලබා දී තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2 (ආ) ඡේදය | ගෙවීමට ඇති මුදල් හා අනෙකුත් වගකීම් නිරවුල් කිරීමෙන් පසු ඉතිරිවන අතිරික්ත මුදල අප්‍රමාදව ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට හා අතිරික්ත අරමුදල් බාහිර ආයතනයන්හි ආයෝජනය කර ඇති විටෙක ඒවා කල්පිරුණු වහාම ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට කටයුතු කළ යුතු වුවද, එකතුව රු.354,632,751 ක් වූ භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර සුරකුම්පත් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.126,399,391 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.171,131,419 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.44,732,028 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වායු තත්ත්වයන් පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය කොළඹදී පැවැත්වීම වෙනුවෙන් රු.36,496,829 ක් අරමුදලින් වැය කිරීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2013 දෙසැම්බර් 31 දිනට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ එක් එක් වාහන පන්තීන් අනුව ලියාපදිංචි කර ඇති මුළු වාහන සංඛ්‍යාව 4,800,555 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී වායු විමෝචන සහතික ලබාගත් වාහන සංඛ්‍යාව 3,324,262 ක් විය. ඒ අනුව වාහන 1,476,293 ක් සඳහා එනම්, මුළු වාහනවලින් සියයට 31 ක් සඳහා වායු විමෝචන පරීක්ෂණ සහතික ලබාගෙන නොතිබූ අතර ව්‍යාජ වායු විමෝචන පරීක්ෂණ සහතික ලබාගන්නා හෝ වායු විමෝචන සහතික ලබා නොගන්නා වාහන තිබේද යන්න හඳුනාගැනීම සඳහා අරමුදල විසින් විධිමත් වූ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

වායු විමෝචන වැඩසටහන සම්බන්ධයෙන් ප්‍රචාරණ වැඩසටහන් සකස් කර, මහජනතාව දැනුවත් කිරීම සඳහා 2012 වර්ෂයේදී මිල ගණන් කැඳවීමෙන් සමාගමක් තෝරාගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී නැවත මිල ගණන් කැඳවීමෙන් තොරව එම සමාගමම තෝරාගෙන ප්‍රචාරණ කටයුතු සඳහා අරමුදල විසින් රු.9,684,741 ක් වැයකර තිබුණි. 2013 ඔක්තෝබර් 15 දින අරමුදල විසින් එම සමාගම සමඟ ගිවිසුමකට එළඹ තිබුණද, ගිවිසුමෙහි ගිවිසුම්ගත කාලයක් සඳහන් කර නොතිබූ අතර ප්‍රචාරණ මාධ්‍යයන්, ඒවායේ පිරිවිතරයන් සහ මිල ගණන් ආදී කරුණු ගිවිසුමට ඇතුලත් කර නොතිබුණි.

### 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පරිසර දූෂණයට ඉවහල්වන වාහනවලින් පිටවන දුම් පාලනය කිරීමේ පරමාර්ථයෙන් වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල ක්‍රියාත්මක කරනු ලැබුවද, එකී අරමුණු ප්‍රමාණවත් ලෙස ඉටු කරගෙන තිබේද, නැද්ද යන්න සනාථ කර ගැනීම සඳහා වායු විමෝචන පරීක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පෙර පැවති තත්ත්වය සහ ක්‍රියාත්මක කිරීමෙන් පසු පැවති

තත්ත්වය පිළිබඳව සංසන්දනාත්මක පාරිසරික දත්ත පදනම් කරගෙන විධිමත් පරිදි ඇගැයීමක් සිදු කර නොතිබුණි.

(ආ) වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල ආරම්භ කරන ලද 2008 නොවැම්බර් 17 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුල පෞද්ගලික සමාගම් දෙක විසින් අයකරනු ලබන වායු විමෝචන පරීක්ෂණ ගාස්තුවෙන් සියයට 10 ක් අරමුදල වෙත ලබා දිය යුතු වේ. ඒ අනුව එකතුව රු.695,679,989 ක් අරමුදල වෙත එවා තිබුණද, සමාගම් දෙක විසින් පරීක්ෂා කරන ලද සියළුම මෝටර් වාහනවලට අදාලව අයකරන ලද වායු විමෝචන පරීක්ෂණ ගාස්තුවලින් අරමුදලේ කොටස නිවැරදිව එවා තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා අරමුදල තුළ නිශ්චිත වූ වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතාවයන් වරින්වර මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අයවැය පාලනය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ගිණුම්කරණය